Department of Education,Sabaragamuwa Province/ Weekly School



විෂය:- ශිල්ප කලා

සතිය- 03

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**පාඩම - ඉලිප්ස ආශ්‍රිත නිර්මාණ කරයි.**

11 ශ්‍රේණියේ පෙළපොතේ පිටු අංක 20 -27 දක්වා අධ්‍යයනය කිරීමෙන් පසු පහත සඳහන් අභ්‍යාසවල නිරත වන්න.

01)

| A කොටස | B කොටස |
|---|---|
| 01.යම්කිසි අචල රේඛාවකටත් එයට බාහිරව පිහිටි අචල ලක්ෂ්‍යයකටත් සෑමවිටම ඇති දුරෙහි අනුපාතය නියතව ගමන් කරන තවත් ලක්ෂයක පථය වන්නේ, | නාභියයි |
| 02.බාහිරව පිහිටි අචල ලක්ෂය | සුළු අක්ෂයයි |
| 03.නාභිය හරහා නියාමක අක්ෂයට ඇඳෙන ලම්භකයේ වක්‍ර තුළ වූ කොටස නියාමක අක්ෂය වන්නේ, | ඉලිප්සය |
| 04.මහා අක්ෂයේ ලම්භක සමච්ඡේදක වක්‍ර තුළ වූ කොටස | මහා අක්ෂයයි |
| 05.වක්‍රය සමඟ ඕනෑම ලක්ෂයක් නාභිය සමඟ රේඛා දෙකකින් යාකළ විට එම රේඛා දෙකෙහි එකතුව සමාන වන්නේ, | සිරස් රේඛාවයි |


02) ඉලිප්සය නිර්මාණය කිරීමට යොදාගන්නා විවිධ ක්‍රම නම් කරන්න.

03) පහත දී ඇති පියවර අනුව මහා අක්ෂය 75 mm ක් වූ සුළු අක්ෂය 50 mm ක් වූ ඒක කේන්ද්‍රික වෘත්ත ක්‍රමය භාවිතා කර ඉලිප්සය නිර්මාණය කරන්න.

- A , B මහා අක්ෂය අඳින්න.
- A හා B සමච්ඡේදනය කර සමච්ඡේදක ස්ථානය O ලෙස නම් කරන්න.
- O සිට සුළු අක්ෂයේදී තිබෙන දිගෙන් අඩක් ගෙන දෙපසට ලකුණු කර එය C සහ D ලෙස නම් කරන්න.
- OA අරය ගෙන O කේන්ද්‍ර කර වෘත්තයක් අඳින්න. එලෙසම OC අරය ගෙන O කේන්ද්‍ර කර වෘත්තයක් අඳින්න.
- වෘත්ත දෙකම එකවිට සමාන කොටස් ගණනකට බෙදන්න.
- එය අංක 1,2,3,4 යනාදී වශයෙන් අංකනය කරන්න.
- විශාල වෘත්තයේ අංක 1 සිට CD සමාන්තර වන ලෙස පහලට රේඛාවක් අඳින්න.
- අංක 2 සිට එම රේඛා සම්මුඛ වන සේ OBට සමාන්තර රේඛාවක් අඳින්න.මෙම සම්මුඛ වන ස්ථානය ඉලිප්සයේ එක් ලක්ෂයක් වේ.

- මෙලෙස අනෙකුත් ලක්ෂයක් සොයා එම ලක්ෂයන් එකිනෙක නිදහස් අතින් යාකර අවශ්‍ය ඉලිප්සය අඳින්න.

04)




i.මෙම ඉලිප්සය ඇඳ ඇත්තේ කුමන ක්‍රමයටද යන්න නම් කර මෙහි පියවර අනුපිළිවෙළින් ලියන්න.

05) ඉහත කුමන හෝ ක්‍රමයක් අනුගමනය කරමින් ඉලිප්සාකාර හැඩයෙන් යුතු අලංකාර බිත්ති සැරසිල්ලක් හෝ බඳුන් පලසක් නිර්මාණය කරන්න.

එය නිර්මාණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ නම් කරන්න. එම නිර්මාණයේ දළ රූප සටහනක් අඳින්න.( ඔබගේ නිර්මාණ ගුරුවරයාගේ නිරීක්ෂණය සඳහා යොමු කරන්න.)